**ශීර්ෂ 149 - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 149 - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 27 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම්**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 9,435.51 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 8,195.57 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,239.94 ක් හෙවත් සියයට 13.14 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,970.17 | 1,773.48 | 196.69 | 9.98 |
| මූලධන | 7,465.34 | 6,422.09 | 1,043.25 | 13.97 |
| **එකතුව** | **9,435.51** | **8,195.57** | **1,239.94** | **13.14** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 14901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 20.00 | 19.93 | 13.00 | 14.91 | 60.00 | 50.35 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ පොදු තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 70.03 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0066/000 | 0.10 |
| 6000/0000/00/0016/0018/000 | 60.34 |
| 6000/0000/00/0018/0022/000 | 2.01 |
| 6000/0000/00/0013/0031/000 | 7.58 |
| **එකතුව** | **70.03** |

## 2.4 විගණන නිරීක්ෂණය

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු රු.48,733,500 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 32 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 32 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 2 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණු එකතුව රු. 15,338,514 ක් තැන්පතු ශේෂ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විගණනයට ඉදිරිපත් කළ විෂය අංක 14901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.100,208 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ වර්ෂ 7 වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) | මුදල් රෙගුලාසි 94(1) | වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ඉක්මවා එකතුව රු.81,886,596 ක් වූ බැරකම්වලට එළඹ තිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 113(4) | සමූපකාර සමිතිවල පැවැති රු.100,000,000 ක් වූ ණය කපා හැරීමට ලබා දී තිබුණු පොතෙන් අස්කිරීමේ නියෝගයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | **අයවැය චක්‍රලේඛ** | | |
| | 2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන චක්‍රලේඛයෙහි 2 ඡේදය | | 1202- ඉන්ධන වැය විෂයයට හා 1401 - ප්‍රවාහන වියදම් වැය විෂයයට සලසා තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 15 ක් හා සියයට 10 ක් වශයෙන් අනිවාර්යෙන්ම ඉතිරි කළ යුතුව තිබුණි. නමුත් අමාත්‍යාංශය විසින් එම වැය විෂයයන්ට සලසා තිබුණු සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව කටයුතු කර වෙනත් වැය විෂයයන් ගෙන් ප්‍රතිපාදන මාරු කර ගෙන උපයෝජනයන් කර තිබුණි. |

## 3.6 දේශිය මුල්‍යකරණ මගින් ව්‍යපෘති ක්‍රියාත්මක කිරිම

**මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

ව්‍යාපෘතියක් සඳහා 2016 දෙසැම්බර් 31 දින වන විට රු.320,000 ක් වැයකර තිබුණත්, අදාළ ව්‍යාපෘතියේ කාර්යයන් ආරම්භ කර හෝ නොතිබුණි.

## 3.7 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**-----------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කළ කර්මාන්තපුර 07 ක ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.153,880,000 ක් වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රමාණවත් භෞතික ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

**--------------------------------------------------------------**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කර්මාන්තපුර ස්ථාපනය කිරීම සඳහා 2016 දෙසැම්බර් 31 දින වන විට අදාළ ඉඩම් හඳුනාගෙන කාර්යයන් ආරම්භ කළ යුතු වුවත්, කර්මාන්තපුර 02 ක ට අදාළව එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**--------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| | ------------ ---- | -------------- | ------------ | --------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 69 | 54 | 15 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 06 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 683 | 525 | 158 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 135 | 120 | 15 |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | | ----- | ----- | ----- |
| | **එකතුව** | **895** | **706** | **189** |
| | | === | === | === |